

# කතෘගෙන්

නගර බද පදිංචි කරුවන්ට හා නගරාසන්න මෑත පිටිසර පෙදෙස්වල වාසය කරන අයටද බෝග වගාව සඳහා එතරම් ඉඩකඩ ප්‍රමාණයක් නැති බැවින් ඔවුන්ට, ගොවිතැන්කර ආදයමක් අතිරේක වශයෙන් ලබා ගැනීම උගහට කරුණකි. එහෙත් සමහර සත්ව පාලන කටයුතුවල යෙදීම සඳහා ජනගහන යෙන් අධික පෙදෙස් පවා සුදුසුවෙයි. සත්ව පාලන කටයුතු අතුරින් නිවෙසට යාබදව හා ගෙවත්තෙහි, එලෙස නාගරික උදවියට පවා යෙදියහැකි පහසුම කාර්‍ය්‍ය කුකුළන් ඇතිකිරීමයි. සත්ව පාලන කටයුතු අතුරින්ද මනුෂ්‍ය තද බදය එතරම් බලපෑමක් නොදක්වන්නේ කුකුල් පාලනයටයි. ඒ අතර ඉතා කෙටි කාලයකදී ආදයමක් ලබා ගත හැක්කේද කුකුළන් ඇති කිරීමෙනි.

එහෙත් කුකුළන් ඇතිකර සැලකියයුතු ආදයමක් ලබා ගැනීමටනම් අඩු වශයෙන් කිකිළියන් සියයක්වත් සිටිය යුතුවෙයි. එමෙන්ම, මෙම කාර්‍ය්‍ය යෙන් ආර්ථික ප්‍රයෝජන උපුටාගත හැක්කේ, උන් නිරෝගී, උසස් පෙළේ, හොඳින් රැකබලාගත් සතුන් වීමෙන් පමණය.

එවැනි ක්‍රමානුකූල කුකුළන් ඇතිකිරීමෙ ව්‍යාපාරයකට ක්‍රමවත්ව සැදුනු "ඩීප්ලිටර්" කුකුළු ගෙයක් වුවමනාකරයි. එයට නිසි උපකරණ හා භාජනද උවමනාකෙරේ. සතුන්ගෙන් ස්ථිර ආදයමක් ලැබෙන තුරු, එනම් දින 180ක් දක්වා උන්ට ආහාර වුවමනාවෙයි. සනීපාරක්ෂක බෙත් හේත් ආදියද වුවමනාවන්නේය. මේ හැමටම වඩා උසස් පෙළේ නිරෝගී සතුන් අවශ්‍යමය. මෙම අවශ්‍යතාවයන් අඩුම ප්‍රමාණයන්ගෙන් සපයා ගැනීම රු. 1500 ක පමණ මූලික ධනයක් වුවමනාවේ. කම්කරු හා මධ්‍යම පංතියේ අයට මෙවැනි මුදලක් සොයා ගැනීම කළ නොහැකි දෙයකි. එවිට එවැනි අය මෙවැනි ආර්ථික ප්‍රයෝජන සහිත විනෝද ව්‍යාපාරයක යෙදෙන්නේ කෙසේද ?

ව්‍යාපාරය සඳහා මූලික ධනය සොයාගැනීම හැකිවුවත්, මෙවැන්නක යෙදී උසස්ම ප්‍රයෝජනයන් ලබාගැනීමට උසස් පාලනයක් වුවමනා කෙරේ. කුකුළන් ඇතිකිරීම පහසු කාර්‍යයක්වුවද, කුකුළු පාලනයෙහි කලින් යෙදී නැති ආධුනිකයින්ට ප්‍රමාණවත් උසස් පාලනයක් ගෙනදීම එතරම් පහසු නොවේ. එබැවින් එවැනි අයට මේ පිළිබඳව මහ පෙන්වීමක් වුවමනාමය. ඔවුන් එවැනි මහ පෙන්වීමක් ලබාගන්නේ කෙසේද?

කුකුළන් ඇති කිරීමෙහිදීද අවශ්‍යවන සේවා පහසුකම් එමට තිබෙයි. නියි කාලවලට සතුන්ට බෙහෙත් එන්නත් කරවාගැනීම ඉන් එකකි. රෝගී සතුන්ට ප්‍රතිකාර කිරීම හා සනීපාරක්ෂක කටයුතු අනුගමනය කිරීම තවෙකකි. මෙවැනි සේවා පහසුකම් ලබාගන්නේ හා ඒ සඳහා සංවිධානය වන්නේ කෙසේද ?

සතුන් ඇතිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා බඩු බාහිරාදිය ලාභයට, පහසුවට හා කලට වේලාවටද ලබා ගැනීම වැදගත් කරුණකි. නිෂ්පාදන, එනම් බිත්තර අලෙවිය, උසස්ම මිළ ප්‍රමාණයකට සිදුකළයුතුවෙයි. ඒ අතර ව්‍යාපාරය වැඩි දියුණු කර ගැනීමට හා නොකඩවා ගෙනයෑමටද මාර්ගය පාද ගතයුතු වන්නේය. එවැනි දේ තනි පුද්ගලයෙකුට කළ හැකි නොවේ. එසේනම් මෙවැනි ව්‍යාපාරිකයින් රැසක් එක් වන්නේ කුමන අන්දමටද?

මේ සියල්ලටම පිළිතුරු සොයා ගැනීම සඳහා " සමුපකාර ක්‍රමයට කුකුළන් ඇතිකිරීම කළුතර දිස්ත්‍රික්කයේ බිහිවූවක් " යන මැයෙන් පළවී ඇති ලිපිය බලන ලෙස සඳහන් කිරීමට කැමැත්තෙමු.